# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 957/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 07/06/2024<br>පැය 1325 | | |

## මාධ්‍ය නිවේදනය

**01. මුදල් හා දේපල කොල්ලකෑමකට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - තඹුත්තේගම පොලිස් ස්ථානය.**

2024.06.06 වන දින තඹුත්තේගම පොලිස් වසමේ යාය 05 ප්‍රදේශයේ පිහිටි නිවසකට අයුතු ලෙස ඇතුළු වූ පිරිසක් පොලිස් නිලධාරීන් බව පවසා නිවැසියන් බැඳ දමා නිවස පරීක්ෂා කර රුපියල් ලක්ෂ 17 ක් වටිනා රන් භාණ්ඩ හා මුදල් කොල්ලකෑමක් සම්බන්ධව තඹුත්තේගම පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලකට අදාල සැකකරුවන් දෙදෙනෙකු තඹුත්තේගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් කොල්ලකන ලද මුදල් හා දේපල සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39 හා 41 වයස්වල පසුවන වරකාපොල හා රිදීගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

තඹුත්තේගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කල්ලංචිය පොලිස් ස්ථානය.**

2024.06.06 වන දින සවස් කාලයේ කල්ලංචිය පොලිස් වසමේ රොටවැව ප්‍රදේශයේදී කල්ලංචිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වන රොටවැව, සීප්පුකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කල්ලංචිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. වීසා නොමැතිව මෙරට රැඳී සිටි විදේශීය ජාතිකයෙකු අත්අඩංගුවට - හබරාදුව පොලිස් ස්ථානය.**

2024.06.06 වන දින සවස් කාලයේදී හබරාදුව පොලිස් වසමේ ගල්කැටිය ප්‍රදේශයේදී ආගමන විගමන කොන්දේසි උල්ලංඝණය කරමින් වීසා නොමැතිව

මෙරට රැඳී සිටි විදේශ ජාතිකයෙකු හබරාදුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන රුසියානු ජාතිකයෙකි.**

හබරාදුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. කර්මන්ත ශාලාවක හදිසි ගිනි ගැනීමක් - නව කුරුඳුවත්ත පොලිස් වසම.

2024.06.06 වන දින සවස් කාලයේ නව කුරුඳුවත්ත පොලිස් වසමේ කුරුඳුවත්ත කඩවීදිය ප්‍රදේශයේ තේ කර්මාන්ත ශාලාවක ගින්නක් හට ගෙන ඇති බවට නව කුරුඳුවත්ත පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත වහා ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන්, මහනුවර ගිනි නිවන ඒකකය නිලධාරීන් හා ප්‍රදේශවාසීන් එක්ව ගින්න මැඩ පැවැත්වීමට කටයුතු කර ඇත.

ගිනි ගැනීම හේතුවෙන් ජීවිත හානිය සිදුව නොමැති අතර ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. නව කුරුඳුවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**